| නම | |
|---|---|
| ප්‍රථම වාර පරීක්ෂණය 10 - ශ්‍රේණිය | |
| **ගණිතය** (I කොටස) | 45 min |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

1) 5, 8, 12, 15 යන සංඛ්‍යා වල මධ්‍යන්‍යය සොයන්න.

2) 15% ක වාර්ෂික සුළු පොලී අනුපාතිකයක් යටතේ රු. 5000 ක මුදලක් ණයට ගත් අයෙකු වසරකට ගෙවිය යුතු පොලිය කීය ද?

3) පහත AB රේඛාව මත කවකටුව භාවිතයෙන් ABC සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න.

A ———————— B

4) Y = 2X - 3 සරළ රේඛාවේ අනුක්‍රමණය සහ අංත:ඛණ්ඩය ලියන්න.

5) වෙළෙන්දෙක් 20% ක ලාභයක් තබාගෙන භාණ්ඩයක් විකුණයි. ලාභය රු. 400 නම්, භාණ්ඩය ගත් මිළ සොයන්න.

6) අනුපිළිවෙලින් ලියා ඇති 18, 19, 21, 25, -------, 28,28, 29 යන සංඛ්‍යාවල මධ්‍යස්ථය 26 වේ නම්, හිස්තැනට සුදුසු අගය කුමක් ද?

7) ඔරලෝසුවක මිනිත්තු කටුවේ දිග 3.7 cm වේ. එම කටුවේ තුඩෙහි පථය විස්තර කරන්න.

8) පහත රේඛාවේ අනුක්‍රමණය 1 වේ. එහි සමීකරණය $y = mx + c$ ආකාරයට ලියා දක්වන්න.




9) 8,4,6 යන සංඛ්‍යා වල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

10) ප්‍රතිලෝම සමානුපාතිකයකට උදාහරණයක් ලියන්න.

11) වපුරණ ලද වී ඇටයක් පැළවීමේ සම්භාවිතාව $\frac{9}{10}$ ක් වන්නේ නම්, වී ඇට 1000 ක් වැපුරූ විට ඉන් කීයක් පැළ වේ යැයි අපේක්ෂා කළ හැකි ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

12) $\frac{3}{5}$ යන්න ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

13) ලම්බ සමච්ඡේදකය නිර්මාණය කිරීමෙන් පහත රේඛාවේ මධ්‍ය ලක්ෂ්‍යය ලබාගන්න.



14) $5+3\times 2$ යන්නෙහි පිළිතුර ලෙස එක්තරා සිසුවෙක් 16 යන්න ලියා තිබුණි. මෙම පිළිතුර වැරදිය. සුළු කිරීමේදී සිසුවා කර ඇති වරද කුමක් ද?

15) පහත රටාවේ ඊළඟ පදය (රූපය) අඳින්න.



16)




X හි අගය සොයන්න.

17) වාහනයක් 35 km / h වේගයෙන් පැය 3 ක් ගමන් කළේ නම්, ගමන් කර ඇති මුළු දුර කොපමණ ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

18)




x හි අගය සොයන්න.

19) සෘජු කෝණික ත්‍රිකෝණයක සෘජුකෝණය අඩංගු පාද මත ඇඳි සමචතුරස්‍රවල වර්ගඵල පිළිවෙලින් $20cm^2$ සහ $15cm^2$ නම්, කර්ණය මත ඇඳි සමචතුරස්‍රයේ වර්ගඵලය කොපමණ ද?

20) $A = \{$ 1 ත් 15 ත් අතර 3 හි ගුණාකාර$\}$ නම්, n (A) සොයන්න.

| | |
|---|---|
| නම | |
| ප්‍රථම වාර පරීක්ෂණය<br>10 - ශ්‍රේණිය | |
| **ගණිතය** (II කොටස | 1 hour 15 min |

❖ *ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.*

1.

(i) අරය 7cm වු වෘත්තයක පරිධිය සොයන්න.

(අරය r වු වෘත්තයක පරිධිය $2\pi r$ මගින් ලැබේ. $\pi = \frac{22}{7}$ වේ ) (ලකුණු 03 )

(ii) ඉහත වැනි වු වෘත්තයක වර්ගඵලය සොයන්න.

(අරය ර වු වෘත්තයක වර්ගඵලය $\pi r^2$ මගින් ලැබේ. ) (ලකුණු 03 )

(iii) අරය 7cm වුද, කේන්ද්‍රය O වුද , වෘත්තයකින් කපාගත් කොටසක් පහත දැක්වේ. මෙවැනි කොටසක් කුමන නමකින් හැඳින්වේද ? (ලකුණු 02 )




To download past papers visit
www.vajirapani.blogspot.com

(iv) AB වැනි වක්‍ර රේඛා කොටසක් කුමන නමකින් හැඳින්වේද? (ලකුණු 02 )

(v) මෙම වෘත්ත කොටස සම්පූර්ණ වෘත්තයෙන් කවර භාගයක්ද ? (ලකුණු 01 )

(vi) AB වක්‍ර රේඛා කොටසෙහි දිග සොයන්න. (ලකුණු 02 )

(vii) ඉහත වෘත්ත කොටසෙහි පරිමිතිය සොයන්න ? (ලකුණු 02 )

2.

(i) ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලිවීමෙන් $\sqrt{256}$ හි අගය සොයන්න. (ලකුණු 02 )

(ii) $\sqrt{70}$ සඳහා වඩාත්ම සුදුසු අගය 8.38 , 8.37 , 8.36 , 8.35 යන අගයයන් අතරින් කවරක්ද? (හේතු දක්වන්න) (ලකුණු 03 )

(iii) සාධාරණ ක්‍රමය භාවිතයෙන් 5.3 හි වර්ගමූලය දශමස්ථාන 02 කට සොයන්න. (ලකුණු 05 )

(iv) $\sqrt{7282.9156} = 85.34$ වේ නම්, $\sqrt{72.829156}$ හි අගය සොයන්න. (ලකුණු 02 )

(v) .............. 154 යන පූර්ණ වර්ග සංඛ්‍යාවේ වර්ගමූලය ............... 35 විය නොහැකි බවට හේතු දක්වන්න. (හිස්තැන් වලින් දැක්වෙන්නේ මැකී ගිය සංඛ්‍යා කිහිපයකි) (ලකුණු 03 )

3. "එක් ත්‍රිකෝණයක කෝණ දෙකක් සහ පාදයක් තවත් ත්‍රිකෝණයක කෝණ දෙකකට සහ අනුරූප පාදයට සමාන වේ නම් ඒවා අංගසම වේ"

(i) ත්‍රිකෝණ අංගසම වීමේ වෙනත් අවස්ථා දෙකක් ඉහත ආකාරයට ලියන්න. (ලකුණු 03 )

(ii) එකිනෙකට වෙනස් අරයෙන් යුත් x සහ y කේන්ද්‍ර වු වෘත්ත දෙකක් A සහ B හිදී එකිනෙක් කැපේ. පහත රූපය පිටපත් කරගන්න. (ලකුණු 01 )




(iii) AX ,AY, BX, BY, XY යා කරන්න. (ලකුණු 01 )

(iv) AX = XB වන්නේ ඇයි ? (ලකුණු 02 )

(v) AXY $\Delta \equiv$ BXY $\Delta$ බව පෙන්වන්න. (ලකුණු 04 )

(vi) $A\hat{Y}X$ = $B\hat{Y}X$ වන්නේ ඇයි ? (ලකුණු 02 )

(vii) AXY යනු සමපාද ත්‍රිකෝණයක් නොවන බවට හේතු දක්වන්න. (ලකුණු 02 )

4.

To download past papers visit
www.vajirapani.blogspot.com

(i) $\frac{3}{4} + \ 2\frac{5}{6} - \frac{2}{3}$ සුලු කරන්න. (ලකුණු 03 )

(ii) $\frac{3}{5} \div \frac{7}{10} \times 1\frac{5}{9}$ සුලු කරන්න. (ලකුණු 03 )

(iii) යම් පුද්ගලයෙකුට ව්‍යාපාරික කටයුත්තක් සඳහා යම් මුදලක් අවශ්‍ය විය. ඉන් $\frac{3}{7}$ ක් බැංකු ණයකින් ලබා ගත හැකිවිය. ඉතිරි මුදල භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 02 )

(iv) ඉතිරියෙන් $\frac{3}{4}$ ක් මිතුරෙකුගෙන් ලැබුණි. එසේ ලැබුණු මුදල අවශ්‍ය මුලු මුදලේ භාගයක් ලෙස ලියන්න. (ලකුණු 03 )

(v) අවසානයේ ඔහුට මදි වු මුදල රු 20, 000 නම්, ඔහුට අවශ්‍ය වු මුලු මුදල කොපමණද ? (ලකුණු 04 )

5. (a).

(i) $(3x-5)(2x+1)$ ප්‍රසාරණය කරන්න (ලකුණු 02 )

(ii) $x^2 - 3x - 10$ සාධක සොයන්න. (ලකුණු 03 )

:b)




PQR ත්‍රිකෝණයේ PQ = PR වේ. RQ = QS වේ.

ඉංග්‍රීසි අකුරු වලින් දක්වා ඇති කෝණ වල අගයයන් ලියන්න.

a = ............................................ b = ..................................................

c = ............................................ d = .................................................. (ලකුණු 08)

:c)




e කෝණයෙහි අගය සොයන්න. (ලකුණු 02 )

සැකසුම - වජිරපානි අරවින්ද